# දළ දේශීය නිෂ්පාදිතය
## 2025 වසරේ දෙවන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය
### පදනම් වර්ෂය 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 වසරේ දෙවන කාර්තුව (( අප්‍රේල් 1 සිට ජුනි 30 දක්වා)) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් (2015) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

ඒ අනුව 2025 වසරේ දෙවන කාර්තුවේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 7,362,510ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,883,559ක් ලෙස වාර්තා වේ. 2024 වසරේ දෙවන කාර්තුව සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 6,661,030ක් සහ රුපියල් මිලියන 2,749,504ක් වශයෙන් වාර්තා වී තිබුණි.

- 2025 වසරේ දෙවන කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4.9 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වසරේ දෙවන කාර්තුවේදී මෙම වර්ධනය සටහන් වුයේ සියයට 4.1 ක ඍණ වර්ධනයක් වශයෙනි.
- 2025 වසරේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 2.0ක හා කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 5.8ක් සහ සියයට 3.9ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත.
- 2025 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු සහ භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු පිළිවෙලින් සියයට 10.1ක්, සියයට 25.1 ක්, සියයට 52.8ක් සහ සියයට 12.0ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.

**අන්තර්ගතය**

2025 දෙවන කාර්තුවේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 9

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## 1.0 2025 වසරේ දෙවන කාර්තුව සඳහා සමස්ත ආර්ථිකයේ හැසිරීම

2025 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4.9 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති බවයි. ඒ අනුව, 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,749,504 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 2,883,559 ක් දක්වා ඉහළ ගොස් ඇත.

රූපසටහන 01
**ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනය - 2024 සහ 2025 දෙවන කාර්තුව**




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 6,661,030 ක් ලෙස වාර්තා වූ අතර එය 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 7,362,510 ක් දක්වා සියයට 10.5 කින් වැඩි වී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 10.1 ක්, සියයට 25.1 ක්, සියයට 52.8 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 12.0 ක් ලෙස වාර්තා වේ.

2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු හා සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 2.0, සියයට 5.8 ක් සහ සියයට 3.9 ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත. භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2025 දෙවන කාර්තුවේදී සියයට 13.5 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇති අතර ඒ සඳහා වාහන ආනයනය වැඩිවීම හේතුවී ඇත.

2025 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය, පෙර වසරේ (2024) දෙවන කාර්තුවේ වාර්තා වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අගයට සාපේක්ෂව ගණනය කෙරේ.

පසුගිය කාර්තු හතක කාලය තුළ පැවති හිතකර ආර්ථික තත්ත්වයන්ගෙන් ප්‍රතිලාභ ලබමින්, ශ්‍රී ලංකා ආර්ථිකය 2025 දෙවන කාර්තුව සඳහා ද සියයට 4.9 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. අඛණ්ඩව අටවන වරටත් වාර්තාවී ඇති මෙම ධනාත්මක ආර්ථික වර්ධනය මගින් කලින් පැවති ආර්ථික පසුබෑමේ අඛණ්ඩ ප්‍රකෘතිමත් වීම ඉස්මතු කරයි. වාහන ආනයන සීමා ඉවත් කිරීමට සාපේක්ෂව අඩු මට්ටමක පැවති පොලී අනුපාත සමඟ සම්බන්ධ වෙමින්, ‘වාහන අලුත්වැඩියාව ඇතුළත් තොග සහ සිල්ලර වෙළඳාම’, ‘ගබඩාකරණ කටයුතු ඇතුළත් භාණ්ඩ හා මගී ප්‍රවාහනය’, ‘මූල්‍ය සේවා කටයුතු’, ‘රක්ෂණ සේවා කටයුතු’ මෙන්ම භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) වැනි ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්

හරහා ආර්ථිකය වර්ධනය කිරීමට සමත්ව ඇත. තවදුරටත්, ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට හුරුපුරුදු ආර්ථික කටයුතු වන 'ඉදිකිරීම්' සහ 'පතල් හා කැණීම්' 2025 දෙවන කාර්තුවේ දී ද සිත්ගන්නා සුළු ප්‍රසාරණයන් වාර්තා කර ඇත. මෙම කාර්තුව තුළ ද 'නිමවුම් කර්මාන්ත' ආශ්‍රිත ක්‍රියාකාරකම් මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත.

2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 2.7 ක වර්ධනයක් වාර්තා කර තිබූ කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ද සමස්තයක් වශයෙන් සියයට 2.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

කලකට පසු 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී බොහෝ කෘෂිකාර්මික ආර්ථික කටයුතු ප්‍රසාරණයන් වාර්තා කර ඇති අතර එහිදී 'සත්ව නිෂ්පාදනය' (සියයට 13.9), 'ධාන්‍ය වගා කිරීම්' (සියයට 12.4), 'පැළ බෝකිරීම්' (සියයට 9.5), 'වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 9.5), 'තේ වගා කිරීම' (සියයට 6.0), 'කෘෂිකාර්මික සහාය සේවා කටයුතු (සියයට 5.9), 'වී වගා කිරීම' (සියයට 5.0), 'උක්, දුම්කොළ හා අනෙකුත් ස්ථිර නොවන බෝග වගා කිරීම' (සියයට 4.3), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 3.8), 'කෝපි, කොකෝවා වගා කිරීම' (සියයට 2.4), 'පළතුරු වගා කිරීම' (සියයට 1.9), 'කුළු බඩු වගා කිරීම' (සියයට 1.2), 'අනෙකුත් ස්ථිර බෝග වගා කිරීම' (සියයට 0.4) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කරමින් දායකවී ඇත.

කෙසේ වෙතත් මෙම කාර්තුවේ දී, 'මිරිදිය ධීවර කටයුතු (සියයට 34.8), 'රබර් වගා කිරීම' (සියයට 10.8), 'කරදිය ධීවර කටයුතු' (සියයට 5.2) සහ 'එළවළු වගා කිරීම' (සියයට 3.6) වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 9.7 ක වර්ධනයක් වාර්තා කර තිබූ සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ද සියයට 5.8 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

එහිදී 'ඉදිකිරීම් කර්මාන්තය' සහ 'පතල් හා කැනීම් කර්මාන්තය' පිළිවෙලින් සියයට 8.5 ක් සහ සියයට 16.6 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

තව ද නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 3.7 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එහිදී 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' (සියයට 21.7), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 17.1), 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 9.7), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 9.6), 'යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය' (සියයට 5.8), 'රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 5.0), 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය'(සියයට 1.5) ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කරමින් දායකවී ඇත..

මේ අතර 2025 දෙවන කාර්තුව තුළ නිමවුම් කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් 'දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන' (සියයට 9.4), 'රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය' (සියයට 5.5), වෙනත් නිමැවුම් කර්මාන්ත'(සියයට 4.4). 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 0.8), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 0.2) ක් වශයෙන් පසුබැසීම් වාර්තා ඇත.

2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතුරෙන් 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' (සියයට 5.3) ක වර්ධනයක් වාර්තා කර ඇත. එසේම 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' හා 'මලාපවහන, අපද්‍රව්‍ය පිරිපහදු කිරීම සහ බැහැර කිරීමේ කටයුතු' පිළිවෙලින් සියයට 5.8 ක හා සියයට 7.0 ක ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2024 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 1.9 ක වර්ධනයක් වාර්තා කර තිබූ සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ද සියයට 3.9 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

සේවා අංශයේ සිදුවී ඇති මෙම වර්ධනය සඳහා 'තොරතුරු තාක්ෂණ සේවා සැපයිමේ කටයුතු' (සියයට 18.7), 'මූල්‍ය සේවා' (සියයට 12.3), තැපැල් හා කුරියර් සේවා' (සියයට 11.6), 'නවාතැන් හා ආහාර පාන සැපයීම' (සියයට 10.3), 'රක්ෂණ සේවා' (සියයට 10.1), 'භාණ්ඩ හා මගී ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 4.8), 'සෞඛ්‍ය සේවා' (සියයට 3.9), 'වෘත්තීය සේවා' (සියයට 3.9), 'දේපොළ වෙළඳාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 3.4), 'විදුලි සංදේශ සේවා' (සියයට 3.3), 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 1.8), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනි විකාශන කාර්යයන්' (සියයට 1.5), 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 1.2) සහ 'අධ්‍යාපනය' (සියයට 1.2), ක් වශයෙන් මෙම කාර්තුවේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. මේ අතර සේවා ආර්ථික කටයුතු අතුරෙන් 'රාජ්‍ය පරිපාලනය' පමණක් සියයට 2.1 ක පසුබැසීමක් 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2024 වසරේ දෙවන කාර්තුවේ දී 242.3ක් (2015=100) ලෙස වාර්තා වන අතර 2025 වසරේ දෙවන කාර්තුවේ දී 255.3ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2025 වසරේ දෙවන කාර්තුවේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 5.4කි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( NCPI ) (2021=100) 2024 වසරේ දෙවන කාර්තුවේ දී 207.5ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2025 වසරේ දෙවන කාර්තුවේ දී 207.6ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2024 වසරේ සිට 2025 වර්ෂය දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 0.03කි.

## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවේදී, සමස්ත කෘෂිකාර්මික අංශය සියයට 2.0ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මෙම අංශයේ එකතු කළ වටිනාකම, පවතින මිල ගණන් යටතේ රුපියල් මිලියන 742,656ක් ලෙස සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 242,114ක් ලෙස වාර්තා වේ. එමෙන්ම, 2025 දෙවන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට සියයට 10.1ක පමණ දායකත්වයක් ලබා දීමට කෘෂිකාර්මික අංශය සමත් වී ඇත.

රූපසටහන 02

**කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2025 දෙවන කාර්තුව**




**මූලාශ්‍රය:**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"ධාන්‍ය වගා කිරීම (වී හැර)" උප ආර්ථික කටයුත්ත 2024 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 17.4 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 12.4 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්තට අයත් ප්‍රධාන ධාන්‍ය නිෂ්පාදනයන් වන බඩ ඉරිඟු, තල, සෝගම් හා මෙනේරි පිළිවෙලින්, සියයට 15.9, සියයට 232.0, සියයට 57.2 හා 32.1 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ඇතැම් නිෂ්පාදනයන් 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව පසුබැසීම් පෙන්නුම් කර ඇත.

"වී වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2024 වසරේ දෙවන කාර්තුව සමඟ සැසඳීමේ දී 2025 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 5.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා එකතු කළ අගය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 32,543 ක් ලෙස වාර්තා වී ඇත.

2025 වසරේ දෙවන කාර්තුවේදී, උඩරට සහ පහතරට එළවළු සඳහා බෝග පුරෝකථන ඇස්තමේන්තු මිශ්‍ර ප්‍රතිඵල පෙන්නුම් කළද, 2024/2025 මහ කන්නයේ නිෂ්පාදනය පහත වැටීම 2025 වසරේ දෙවන කාර්තුවේදී එළවළු නිෂ්පාදනය පහත වැටීමට හේතු විය. 2025 වසරේ යල වගා කන්නය සඳහා බෝග පුරෝකථන වාර්තාවේ, උඩරට එළවළු වල අපේක්ෂිත නිෂ්පාදනය 12.7 කින් වැඩිවීමක් ලෙස සහ, පහතරට එළවළු සියයට 11.2 කින් පහත වැටීමක් ලෙස පුරෝකථනය කර ඇත. එසේම දෙවන කාර්තුවේ එළවළු නිෂ්පාදනයට එක් මාසයක පමණක් දායකත්වයක් සපයන මහ කන්නයේ අවසාන වාර්තාව අනුව එළවළු නිෂ්පාදනය සියයට 12.6 කින් අඩු වී ඇත. එබැවින් 2025 වසරේ දෙවන කාර්තුව සඳහා 'එළවළු වගා කිරීමේ' ස්ථාවර මිළ යටතේ දළ එකතු කළ අගය සියයට 3.6 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කළේ ප්‍රධාන වශයෙන් 2024/2025 මහ කන්න නිෂ්පාදනයේ වාර්තා වූ පහත වැටීම හේතුවෙනි. තවද, නිෂ්පාදකයින්ගේ මිල ඉහළ යාමත් සමඟ, වත්මන් මිලට එකතු කළ අගය සියයට 30.5 කින් වැඩි විය. ජනප්‍රිය එළවළු ලෙස, ගෝවා, වම්බටු, මඤ්ඤොක්කා, කැරට්, තක්කාලි සහ බෝංචි නිෂ්පාදන මිශ්‍රණයේ ඉහළම දායකත්වයක් ලබා දුන් බෝග වර්ග ලෙස දැක්විය හැක.

"තෙල් සහිත පලතුරු වගාව" යන ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේ දෙවන කාර්තුවේදී සියයට 3.8ක වර්ධනයක් වාර්තා කර ඇත. පොල්, තැඹිලි සහ කටුපොල් වගාවන්ගෙන් සමන්විත මෙම අංශය, රටේ දළ දේශීය නිෂ්පාදනයට ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 26,077ක වටිනාකමක් එකතු කර ඇති අතර සියයට 1.4ක දායකත්වයක් ලබා දී තිබේ. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව පොල් ගෙඩි නිෂ්පාදනය සියයට 3.4කින් ඉහළ යෑමයි. ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය පවසන පරිදි 2024 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා පැවති දීර්ඝ වියළි කාලගුණය හේතුවෙන් 2025 වසරේ මුල් මාසවල (ජනවාරි සහ පෙබරවාරි) පොල් අස්වැන්න අඩු වුවද, ඉන් පසුව පැවති හිතකර දේශගුණික තත්ත්වයන් නිෂ්පාදනය වර්ධනය වීමට හේතු වී ඇත. නිෂ්පාදනය වැඩි වුවද, 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවේදී පොල් ගෙඩියක මිල සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. නිෂ්පාදකයාගේ මිල සියයට 82.7කින් ද, සිල්ලර මිල සියයට 80.2කින් ද ඉහළ ගොස් ඇත. 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ පොල් ගෙඩි අපනයනය සියයට 21.3 කින් පමණ සැලකියයුතු ලෙස පහළ ගොස් ඇති අතර තැඹිලි අපනයනය සියයට 31.3 කින් වර්ධනය වී ඇත.

"තේ වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2025 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 6.0 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එය 2024 වසරේ දෙවන කාර්තුවේදී වාර්තා වූ සියයට 8.5ක පසුබැසීමට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයකි. 2025 වසරේ දෙවන කාර්තුවේ දී "නිමි තේ" නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 6.0 ක වර්ධනයක් වාර්තා කර ඇත. කොළඹ වෙළඳපොළෙහි නිමි තේ කිලෝවක සාමාන්‍ය මිළ, පසුගිය වසරේ මෙම කාර්තුව හා සැසඳීමේ දී රු. 1,243.54 සිට රු. 1,139.55 දක්වා සියයට 8.4 ක පසුබැස්මක් වාර්තාවී ඇත. තේ නිෂ්පාදනය සඳහා සියයට 57.8 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහත රට තේ නිෂ්පාදනය සියයට 2.7 ක වර්ධනයක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

2025 වසරේ දෙවන කාර්තුවේදී, "රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය සියයට 10.8කින් සහ නිෂ්පාදන ප්‍රමාණය සියයට 12.8කින් පහත වැටී ඇත. මෙය, 2024 වසරේ දෙවන කාර්තුවේදී වාර්තා වූ "රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ සියයට 13.3ක සෘණ වර්ධනයට වඩා අඩු සෘණ වර්ධනයක් වේ. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුව, මෙම කාර්තුවේ නිෂ්පාදන පහත වැටීමට ප්‍රධාන හේතු වී ඇත්තේ, මාර්තු-අප්‍රේල් කාලය රබර් වගාවේ දළු දමන කාලය වීම සහ මැයි-ජූනි කාලය අධික වර්ෂාව ලැබෙන කාලය වීම වේ. එමෙන්ම එම ආයතනයට අනුව සකස් කළ රබර් කිලෝග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයේ සාමාන්‍ය මිල රු. 713.23 සිට රු. 935.85 දක්වා සියයට 31.2ක ඉහළ යාමක් පෙන්නුම් කර ඇත.

"අනෙකුත් ස්ථිර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2024 වසරේ දෙවෙනි කාර්තුවට සාපේක්ෂව මෙම සමස්ත ආර්ථික කටයුත්ත ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 6,991 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 0.4ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත.

'සත්ත්ව නිෂ්පාදනය'යන ආර්ථික කටයුත්ත කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේ දෙවන කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 26,745 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දී ඇති අතර සියයට 1.6 ක දායකත්වයක් ලබාදී ඇත. මෙම කාර්තුව තුළ දී සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 13.9 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම සියයට 10.9 ක, බිත්තර නිෂ්පාදනය සියයට 35.3 ක හා කිරි නිෂ්පාදනය සියයට 2.5 කින් වැඩි වී ඇත. එමෙන්ම 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම, ගවයන් ඇති කිරීම සහ

එළවළු ඇති කිරීම සහ දියර කිරි ලීටරයක මිල යන නිෂ්පාදකයාගේ මිල ගණන් ඉහළ ගොස් ඇත. බිත්තරයක නිෂ්පාදකයාගේ මිල සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

“පැළ හා බීජ ප්‍රවර්ධනය” යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ රට තුළ පොල්, තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, මල් හා පලතුරු යන පැළ වර්ග නිෂ්පාදනය කිරීමයි. 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම වසරේ දෙවන කාර්තුව තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 208 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 9.5 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. මෙම පැළ වර්ග අතරින් ඉහල දායකත්වයක් දරනු ලබන කුරුඳු පැළ නිෂ්පාදනය 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවේදී සියයට 21.3 ක වැඩි වීමක් වාර්තා කිරීම “පැළ හා බීජ ප්‍රවර්ධනය” යන ආර්ථික ක්‍රියාකාරකමේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

කෘෂි සහායක කාර්යයන් යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් වී වගාවේදී, කුඹුරු බිම් සකස් කිරීමේදී හා අස්වනු නෙලීමේදී පිලිවෙලින් රෝද හතරේ හා රෝද දෙකේ ට්‍රැක්ටර් මෙන්ම ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍ර (Combined Harvestor) සහ අනෙකුත් සහායක සේවා යොදා ගනු ලබයි. එම සේවය ලබා දීම තුලින් ආර්ථිකයට ජනනය වන වටිනාකම මෙහිදී සලකනු ලබයි. ඊට අමතරව ධාන්‍ය වගා හෝග කිහිපයක් හා උඩරට එළවළු හෝග සඳහා වන සහායක සේවා සැපයුම මීට එකතු කරනු ලබයි. 2025 වසරේ යල කන්නය සඳහා ඇස්තමේන්තු ගත, අපේක්ෂිත බිම් ප්‍රමාණයන් අනුව, වී වගා බිම් ප්‍රමාණය ඉහළ යාම පුරෝකතනය කොට ඇති අතර ඒ අනුව එම බිම් ප්‍රමාණය තුල කෘෂි යන්ත්‍රෝපකරණ යෙදවුම් හි ඉහළ යාමේ බලපෑම, 2025 වසරේ දෙවැනි කාර්තුවේ ඇස්තමේන්තුව තුල පෙන්නුම් කරයි. මෙම ඉහළ යාම කෘෂි සහායක කාර්යයන්හි 5.9 ක ප්‍රතිශතාත්මක වර්ධනය කෙරෙහි හේතු විය.

“වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය” යන උප කෘෂිකාර්මික ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය නියෝජනය වන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිෂ්පාදනය තුලින් ජනනය වන වටිනාකමයි. දර නිෂ්පාදනය තුලින් ආර්ථිකයට එකතු වන අගය ඇස්තමේන්තු කරනු ලබන්නේ, දර පරිභෝජන අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීම ඔස්සේය. දර පරිභෝජන අවශ්‍යතාවය ගෘහස්ථ, කර්මාන්ත සහ වෙනත් වශයෙන් වෙන් වෙන්ව ඇස්තමේන්තු කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින් එක් රැස් කරනු ලබන දැව හෝග කපා හෙලීම් වල නිමැවුම් වටිනාකමේ වැඩි වීමක්, පසුගිය වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී පෙන්නුම් කොට ඇත. එමෙන්ම, රාජ්‍ය දැව සංස්ථාවේ දැව කඳන් නිෂ්පාදනය ද සියයට 18.3 කින් පමණ ඉහළ යාමක් මේ කාර්තුවේ දී වාර්තා කොට ඇත. ඒ අනුව, ස්ථාවර මිළ ගනන් අනුව මෙම ආර්ථික කටයුත්ත මෙම කාර්තුව තුල සියයට 9.5 ක ධන වර්ධනයක් පෙන්නුම් කරයි.

“කරදිය මත්ස්‍ය නිෂ්පාදනය” යන ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේ දෙවන කාර්තුව තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 22,960 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දී ඇති අතර සියයට 0.9ක දායකත්වයක් ලබාදී ඇත. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තාවලට අනුව 2024 දෙවන කාර්තුවට සාපේක්‍ෂව, 2025 දෙවන කාර්තුවේදී වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය සියයට 2.1 ක වර්ධනයක් හා ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 13.1 ක පසුබැසීමක් වාර්තා වන අතර සමස්ත කරදිය මත්ස්‍ය නිෂ්පාදනය තුළ 2025 වසරේ දෙවන කාර්තුවේදී සියයට 5.3ක පසුබැසීමක් දක්නට ලැබේ. එසේම සමස්ත කරදිය මත්ස්‍ය නිෂ්පාදනය තුළ නිෂ්පාදකයාගේ මිල සහ සිල්ලර මිල ගණන් සලකා බැලීමේදී සැලකිය යුතු මිල වැඩිවීමක් 2025 වසරේ දෙවන කාර්තුවේදී දක්නට ලැබේ. ඒ අනුව, 2024 දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 දෙවන කාර්තුවේදී “කරදිය මත්ස්‍ය නිෂ්පාදනය” ආර්ථික ක්‍රියාකාරකම එකතු කළ අගය සියයට 5.2 ක පසු බැස්මකට ලක් වී ඇත.

“මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවි වගාව” ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේ දෙවන කාර්තුව තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,797 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දී ඇති අතර සියයට 0.1ක දායකත්වයක් ලබාදී ඇත. එමෙන්ම, 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවේදී “මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවි වගාව” ආර්ථික ක්‍රියාකාරකම එකතු කළ අගය සියයට 34.8 කින් පසු බැස්මකට ලක් වී ඇත.

## 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවේ දී සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 5.8ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 1,851,517ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 809,720 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2025 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 25.1ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 03
කාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2025 දෙවන කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවේ දී ‘පතල් හා කැනීම්' ආර්ථික කටයුත්තේ සියයට 16.6 ක වර්ධනයට හේතු වූයේ 'ඉදිකිරීම් ද්‍රව්‍ය කැණීම්' සහ 'මැණික් කැනීම්’ වර්ධනය වීම වේ. 2025 වසරේ දෙවන කාර්තුවේදී මෙම කර්මාන්තයේ මුළු එකතු කළ අගයෙන් සියයට 83.7 ක් 'ඉදිකිරීම් ද්‍රව්‍ය කැනීම්’ දායක වූ අතර එය සියයට 10.8 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. 2025 වසරේ දෙවන කාර්තුවේදී 'මැණික් කැනීම්’ සියයට 66.2 ක වර්ධනයක් වාර්තා කළ අතර ‘නිල් මැණික්’, ‘ස්ටාර් රූබි මැණික්’ සහ ‘රූබි මැණික් ‘එහි එකතු කළ අගයෙන් වැඩි ප්‍රමාණයක් වේ. ඊට අමතරව, 'වෙනත් ඛනිජ කැනීම්’ සියයට 4.4 ක වර්ධනයක් වාර්තා කර ඇත.

“විදුලිය, ගෑස්, උණුසුම් වායු සැකසුම් සැපයුම” උප ආර්ථික කටයුත්ත සම්බන්ධයෙන් ගත්කළ සමස්ත විදුලිය ජනනය 2024 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ ගිගාවොට් පැය 4,315 සිට 2025 වසරේ දෙවන කාර්තුවේ දී ගිගාවොට් පැය 4,455 දක්වා සියයට 3.2 කින් පමණ වැඩි වී ඇත. මෙහිදී ජල විදුලි ජනනය සියයට 37.0 කින් පමණ වැඩිවී ඇති අතර තාප හා ගල් අඟුරු විදුලි ජනනය සියයට 23.8 කින් අඩුවී ඇත. විශේෂයෙන් විදුලිය ජනනයේදී අඩු අතරමැදි වියදමක් යෙදවීමෙන් වැඩි එකතු කල අගයක් ලබා දෙන පුනර්ජනනීය විදුලිය ජනනය, සියයට 16.4 කින් පමණ 2025 වසරේ දෙවන කාර්තුවේ දී වැඩිවී ඇත. ඒ අනුව තාප හා ගල් අඟුරු විදුලි ජනනයේ අඩුවීමේ බලපෑම හේතුවෙන් 2025 වසරේ දෙවන කාර්තුවේ දී ලංකා විදුලි බල මණ්ඩලයේ නිමැවුමේ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ සියයට 38.2 ක අඩුවීමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් ලංකා විදුලි බල මණ්ඩලය තනිව ගත් කල එහි ස්ථාවර මිල යටතේ එකතු කල අගය සියයට 1.8ක අඩු වීමක් පෙන්වයි. ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කෙරෙන විදුලිය නිමැවුම් වටිනාකම 2025 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 5.3ක වැඩිවීමක් වාර්තා කර ඇති අතර ඒ සඳහා පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනයේ නිමැවුම් අගයේ ඉහළ යාම වැඩි වශයෙන් බලපා ඇත. තව ද 2025 වසරේ දෙවන කාර්තුවේ දි ජල විදුලිය නිෂ්පාදනය හා පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනය සම්බන්ධයෙන් පැවති වාසිදායක තත්ත්වය යටතේ 2024 වසරේ දෙවන කාර්තුවේ දී 29:47:24 ක් ලෙස වාර්තා වූ ජල විදුලිය: තාප විදුලිය: පුනර්ජනනීය විදුලිය අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුවේ දි 38:35:27 ක් ලෙස වෙනස් වී ඇත.

2025 වසරේ දෙවන කාර්තුවේදී ජල එකතු කිරීම, පිරිපහදු කිරීම සහ සැපයුම් ආර්ථික ක්‍රියාකාරකමේ නිෂ්පාදකයින්ගේ මිල වැඩිවීම සියයට 16.9 කින් සහ ජල ප්‍රමාණය සියයට 2.3 කින් පමණක් ඉහළ ගොස් තිබේ. මේ අතර, 2024 වසරේ දෙවන කාර්තුව සහ 2025 වසරේ දෙවන කාර්තුව අතර විදුලි ගාස්තු අඩු කිරීම හේතුවෙන් මෙම කාර්තුවේදී අතරමැදි වියදම්වල අඩුවීමක් වාර්තා විය. කෙසේ වෙතත්, ස්ථාවර මිල යටතේ දළ නිමැවුම සියයට 2.3 කින් පමණ වැඩි වූ අතර අතරමැදි

පරිභෝජනය සියයට 3.0 ක අඩුවීමක් වාර්තා කළ අතර එමගින් ස්ථාවර මිල යටතේ එකතු කළ දළ අගය සියයට 5.8 කින් වැඩි විය.

2024 වසරේ දෙවන කාර්තුව හා සසඳන විට, 2025 වසරේ දෙවන කාර්තුවේදී ‘ඉදිකිරීම්’ ක්‍රියාකාරකම් සියයට 8.5 කින් ඉහළ ගොස් තිබේ. මෙම කාර්තුවේදී ඉදිකිරීම් කටයුතු දළ දේශීය නිෂ්පාදිතයට දක්වන කොටස සියයට 5.9ක් ලෙස වාර්තා වී තිබේ. තවද, 2025 වසරේ දෙවන කාර්තුව තුළ සිමෙන්ති සැපයුම සියයට 10.8කින් ඉහළ ගොස් ඇති අතර CIDA පිරිවැය දර්ශකය අනුව සිමෙන්ති, යකඩ හා වානේ, දැව, වෙනත් අමුද්‍රව්‍ය පිළිවලින් සියයට 8.5, 7.8, 0.6, 1.2කින් පහත වැටීම මෙම වර්ධනයට හේතු වී තිබේ.

### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

සමස්ත දළ දේශීය නිෂ්පාදනය තුල, කර්මාන්ත අංශයට සියයට 16.2 වැඩිම දායකත්වය සපයන නිෂ්පාදන කර්මාන්ත අංශය 2024 වසරේ වාර්තා වූ සියයට 5.0ක වර්ධනයට වඩා අඩු වුවද 2025 වසරේදී සියයට 3.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. ස්ථාවර මිල ගණන් යටතේ, 2024 වසරේ දෙවන කාර්තුවේදී සමස්ත දළ දේශීය නිෂ්පාදනයට, නිෂ්පාදන කර්මාන්ත ක්‍රියාකාරකම් දායකත්වය රුපියල් මිලියන 451,751 සිට 2025 දෙවන කාර්තුවේදී රුපියල් මිලියන 468,300ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වී ඇත්තේ, මෙම කාර්තුව තුළ බොහෝ නිෂ්පාදන කර්මාන්ත සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කිරීමයි.

නිෂ්පාදන කර්මාන්ත අංශයට 2025 වසරේ දෙවන කාර්තුවේදී සියයට 6.1 වැඩිම දායකත්වය, සමස්ත දළ දේශීය නිෂ්පාදනයට ලබාදෙන ආහාරපාන හා දුම්කොළ නිෂ්පාදනයට අදාළ උප ක්‍රියාකාරකම සියයට 1.5කින් මෙම කාර්තුවේදී වර්ධනය වී ඇත. මෙම වර්ධනය, 2024 වසරේ දෙවන කාර්තුවේදී වාර්තා වූ සියයට 5.0ක ධන වර්ධනයට සාපේක්ෂව අඩු අගයක් ගත්තද, තවමත් ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත. එමෙන්ම මෙම අංශයට අදාල ආනයන හා අපනයන ප්‍රමාණ සැලකීමේදී අපනයන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් ආනයන වැඩිවීම තුළින් මෙම අංශයේ වර්ධනයේ මන්දගාමී බවක් පෙන්නුම් කර ඇත.

එමෙන්ම නිෂ්පාදන කර්මාන්ත අංශයට 2025 වසරේ දෙවන කාර්තුවේදී සියයට 4.4ක දායකත්වයක් ලබාදෙන රෙදි පිළි ඇඟලුම් හා සම් නිෂ්පාදන කර්මාන්තය 2024 වසරේ දෙවන කාර්තුවේදී වාර්තා කල සියයට 6.4 ක වර්ධනය තව දුරටත් ඉහළ නංවමින් 2025 වසරේ දෙවන කාර්තුවේදී 9.6 ක සැලකියයුතු වර්ධනයක් වාර්තා කර ඇත. තවද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන වෙළඳ දර්ශකයේ මෙම ක්‍රියාකාරකමට අදාල අපනයන ප්‍රමාණ දර්ශකයේ සියයට 7.4ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2025 දෙවන කාර්තුවේදී, ගල් අඟුරු සහ පිරිපහදු කළ පෙට්‍රෝලියම් නිෂ්පාදන අංශය සියයට 21.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. මෙය 2024 දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 13.7 ක හැකිලීමට වඩා සැළකිය යුතු ප්‍රසාරණයකි. මෙම ප්‍රසාරණය ප්‍රධාන හේතුව වී ඇත්තේ, එම කාලය තුළ පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රමාණය සියයට 20.1 කින් ඉහළ යාම වේ.

2025 වසරේ දෙවන කාර්තුවේදී, රසායනික හා ඖෂධ නිෂ්පාදන යන උප ක්‍රියාකාරකම සියයට 5.5ක පසුබෑමක් වාර්තා කර ඇත. මෙය 2024 වසරේ දෙවන කාර්තුවේදී වාර්තා වූ සියයට 22.7ක ධන වර්ධනයට සාපේක්ෂව සැළකිය යුතු පසුබෑමකි.

රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තය 2024 වසරේ දෙවන කාර්තුවේදී සියයට 7.1 ක වර්ධනයක් වාර්තා වූ මෙම උප ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේ එම කාර්තුවේදී තවදුරටත් සියයට 5.0 ක වර්ධනයක් වාර්තා කර ඇත.

එමෙන්ම මූලික ලෝහ සහ සකස් කරන ලද ලෝහ නිෂ්පාදනය සියයට 9.7 කින්ද, 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය සියයට 17.1 කින්ද, යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය සියයට 5.8 කින්ද 2025 වසරේ දෙවන කාර්තුවේදී වර්ධනයන් වාර්තා කර ඇත.

නමුත් 2025 වසරේ දෙවන කාර්තුවේද දැව හා දැවමය නිෂ්පාදන කර්මාන්තය සියයට 9.4කින් ද, කඩදාසි හා කඩදාසි නිෂ්පාදන කර්මාන්තය සියයට 0.8 කින්ද, අනෙකුත් නිමවුම් කර්මාන්තය හා අළුත්වැඩියාව සියයට 4.4 කන්ද, ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය සියයට 0.2කද හැකිලීම් වාර්තා කර ඇත.

## 1.3 සේවා ආර්ථික කටයුතු

2025 වසරේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 3.9ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,886,597ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 1,635,111 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2025 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52.8ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 04
සේවා ආර්ථික කටයුතුවල වර්ධනය -2025 දෙවන කාර්තුව




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"තොග සහ සිල්ලර වෙළඳාම" 2025 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 12ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2024 වසරේ දෙවන කාර්තුවේ වාර්තාවූ සියයට 1.0ක ධන වර්ධනය හා සැසඳීමේදී 2025 දෙවන කාර්තුවේදී සියයට 1.8ක ධන වර්ධනයක් පෙන්නුම් කර ඇත.

"තොග හා සිල්ලර වෙළඳාම" යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාමට අමතරව ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, විද්‍යුත් උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ වෙළෙඳාම යනාදිය ආවරණය කරයි.

භාණ්ඩ ආනයන සහ තොග හා සිල්ලර වෙළෙන්දන් හරහා පාරිභෝගිකයන් අතට පත්වන දේශීය භාණ්ඩ නිෂ්පාදිතයේ උච්ඡාවචනයන් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2024 වසරේ දෙවන කාර්තුව සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 1,290,193 වූ අතර 2025 වසරේ දෙවන කාර්තුව සඳහා එය රු. මිලියන 1,459,020 දක්වා සියයට 13.1කින් වැඩිවී ඇත. එසේම, මෙම කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2024 වසරේ දෙවන කාර්තුවේ පැවති රු. මිලියන 220,418 සිට රු. මිලියන 364,551 දක්වා සියයට 65.4කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2024 දෙවන කාර්තුව හා සසඳන විට 2025 වසරේ දෙවන කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 52.5කින් ද, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 16.1කින් ද වැඩිවී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2024 වසරේ දෙවන කාර්තුව හා සසඳන විට 2025 වසරේ දෙවන කාර්තුවේදී ලෝකයේ සෙසු රටවල් වෙත යොමු වූ මුළු අපනයන වටිනාකම සියයට 5.4කින් ප්‍රසාරණය වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 6.8කින් වැඩිවී තිබේ. එහිදී මෙම කාර්තුවේදී කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 3.2කින් ද කාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 7.4කින් ද වැඩිවී ඇත.

භාණ්ඩ සහ මගීන් ප්‍රවාහනය සහ ගබඩා කිරීමේ ක්‍රියාකාරකම්' යනු ගොඩබිම් ප්‍රවාහනය, ජල ප්‍රවාහනය, ගුවන් ප්‍රවාහනය සහ ගබඩා කිරීම සහ ප්‍රවාහනය සඳහා ආධාරක ක්‍රියාකාරකම්වල එකතුවකි. 2025 දෙවන කාර්තුවේදී, ප්‍රවාහනයේ සංරචක හතරෙන් ඉහළම කොටස හිමි ගොඩබිම් ප්‍රවාහන ක්‍රියාකාරකම් සියයට 4.0ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට පහසුකම් සැලසීම සඳහා, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මගී කිලෝමීටර ගණන සියයට 7.4 කින් සහ අන්තර් පළාත් ගමන් ඇතුළුව පෞද්ගලික බස් රථවල මගී කිලෝමීටර ගණන සියයට 66.6 කින් වැඩි විය. ඊට අමතරව මෙම කාලය තුළ වාහන ලියාපදිංචියේ සැලකිය යුතු වැඩිවීම ද ගොඩබිම් ප්‍රවාහනය පුළුල් කිරීමට තවදුරටත් දායක විය. 2025 දෙවන කාර්තුවේදී ගුවන් ප්‍රවාහන මගී කිලෝමීටර ප්‍රමාණයද සියයට 19.1 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර BOP ජල ප්‍රවාහන දත්ත සියයට 64.6 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. මෙම කාලය තුළ ගබඩා කිරීම ඇතුළුව ප්‍රවාහනය සඳහා ආධාරක ක්‍රියාකාරකම් ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත්තේ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වරායන් තුල බහාලුම් මෙහෙයුම් කටයුතු වල සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමිනි. අවසාන වශයෙන් ඉහත ක්‍රියාකාරකම් ඇතුළුව සමස්ත ප්‍රවාහන ක්‍රියාකාරකම් 2025 දෙවන කාර්තුවේදී සියයට 4.8 ක වර්ධනයක් වාර්තා කර ඇත.

2025 දෙවන කාර්තුවේදී 'තැපැල් සහ කුරියර් ක්‍රියාකාරකම්' පෙර වසරේ එම කාර්තුවට සාපේක්ෂව සියයට 11.6කින් වර්ධනය විය. තැපැල් දෙපාර්තමේන්තුවේ ආදායම සියයට 11.0කින් වැඩි වී ඇති අතර එකතු කළ අගයෙන් විශාල කොටසක් නියෝජනය කරන කාර්ය මණ්ඩල පිරිවැය සියයට 12.2 කින් වැඩි වී ඇත. මේ අතර, කුරියර් ක්‍රියාකාරකම් සියයට 22.2ක ප්‍රසාරණයක් වාර්තා කළ අතර තැපැල් දෙපාර්තමේන්තුව පමණක් මෙම කාර්තුවේදී සියයට 7.6 ක වර්ධනයක් වාර්තා කළේය.

"නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම" යන ආර්ථික කටයුත්ත 2024 වසරේ දෙවන කාර්තුවේ වාර්තා කල සියයට 22.5 ක වර්ධනයට සාපේක්ෂව 2025 දෙවන කාර්තුවේදී දී සියයට 10.3කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) වාර්තාවලට අනුව, 2024 දෙවන කාර්තුවේදී විදේශීය සංචාරකයින් 374,465ක් පැමිණ තිබූ අතර, 2025 වසරේ එම සංඛ්‍යාව 445,768 දක්වා ඉහළ ගොස් ඇත. එමෙන්ම ඓතිහාසික ස්ථාන සහ සංචාරක ආකර්ෂණීය ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන දේශීය සහ විදේශීය සංචාරකයන් සංඛ්‍යාවද ඉහල ගොස් ඇත. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2025 වසරේ දෙවන කාර්තුව තුළ කාර්තුමය පිරිවැටුම 2024 වසරේ දෙවන කාර්තුවේ කාර්තුමය පිරිවැටුම හා සසඳන විට සියයට 7.2 කින් අඩු වි ඇත.

වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම" යන සේවා ආර්ථික කාර්යය සියයට 1.5 ධනාත්මක වර්ධනයක් 2025 වසරේ දෙවන කාර්තුවේ වාර්තා කර ඇත. සංරචක දෙකක් යටතේ, ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදන සියයට 1.9ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර විකාශන කාර්යයන් මෙම කාර්තුවේදී සියයට 1.5කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම උප ආර්ථික කටයුත්තෙහි අතරමැදි වියදම්වල අඩු වීම දළ එකතු කළ අගය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

'විදුලි සංදේශ සේවා' 2024 වසරේ දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 6.6ක වර්ධනයට සාපේක්ෂව අඩු වර්ධනයක් වුවද තවදුරටත් 2025 දෙවන කාර්තුව තුළ සියයට 3.3ක ධන වර්ධනයක් වාර්තා කළේය. මෙම කාර්තුවේදී, රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සහ ජංගම දුරකථන සම්බන්ධතා පිළිවෙලින් සියයට 0.6කින් සහ සියයට 1.0කින් අඩු වුවද, මෙම වර්ධනය සඳහා දත්ත භාවිතය සහ අන්තර්ජාලය සහ විද්‍යුත් තැපැල භාවිතා කරන සම්බන්ධතා සංඛ්‍යාව පිළිවෙලින් සියයට 21.6 කින් සහ සියයට 1.4 කින් ලෙසින් සිදුවූ වර්ධනය සහ විදුලි සංදේශ සේවාවල වාර්තා වූ සියයට 3.3 ක වර්ධනය හේතුවී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.7ක දායකත්වයක් සපයන තොරතුරු තාක්‍ෂණය (IT) සහ තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ සේවා (ITES) ඇතුළු "පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්", 2025 දෙවන කාර්තුව හා සසඳන විට මෙම කාර්තුවේ දී සියයට 18.7 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා වලට අනුව, 2025 දෙවන කාර්තුව තුළ IT/ITES සේවාවන් වන 'පරිගණක සේවා', 'වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා' සහ 'තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ අනෙකුත් ව්‍යාපාරික සේවා' යන ප්‍රධාන සේවා කාණ්ඩවල අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 205 සිට ඩොලර් මිලියන 216 දක්වා, ඩොලර් මිලියන 38 සිට ඩොලර් මිලියන 70 දක්වා සහ ඩොලර් මිලියන 60 සිට ඩොලර් මිලියන 72 දක්වා ඉහළ ගොස් තිබේ. මෙම

අංශ එක්ව, පෙර වසරේ මෙම කාර්තුව හා සසඳන විට අපනයන ආදායමෙන් (ඇමරිකානු ඩොලර් අනුව) සියයට 18.2 ක ඒකාබද්ධ වර්ධනයක් වාර්තා කර ඇත. ඊට අමතරව, 2025 දෙවන කාර්තුවේදී, මෙම කාණ්ඩ තුනෙහි ඒකාබද්ධ අපනයන ආදායම (රු. මිලියන අනුව) 2024 දෙවන කාර්තුවේ පැවති රුපියල් මිලියන 91,041 සිට රුපියල් මිලියන 107,088 දක්වා ඉහළ ගිය අතර, එය මෙම කාර්තුව තුළ සියයට 17.6ක ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරයි.

''මූල්‍ය සේවා සැපයීම'' ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ප්‍රධාන වශයෙන් ගෘහ අංශයේ තනි පුද්ගලයින්ගෙන් සමන්විත අවිධිමත් අංශයක් සමඟ සපයනු ලබන මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ප්‍රධාන සේවා වේ. 2025 වසරේ දෙවන කාර්තුවේදී මූල්‍ය ආයතන වල, ණය සහ අත්තිකාරම්වල සියයට 14.0ක විශාල වැඩිවීමක් දක්නට ලැබුණු අතර, එය "මූල්‍ය සේවා සැපයීම" ආර්ථික කටයුත්තේ සියයට 12.3ක ධනාත්මක වර්ධනයට හේතුවිය. එමෙන්ම මෙම කාර්තුවේදී මූල්‍ය ආයතනවල, මුළු තැන්පතු වල වටිනාකම ද සියයට 13.1කින් වර්ධනය වී ඇත. "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය" (AWLR) 2024 දෙවන කාර්තුවේ 12.5 සිට 2025 දෙවන කාර්තුවේ 11.6 දක්වා වෙනස් වී ඇති අතර "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය" (AWDR) 2024 දෙවන කාර්තුවේ 8.4 සිට 2025 දෙවන කාර්තුවේ 6.9 දක්වා වෙනස් වී ඇත.

"රක්ෂණ, ප්‍රතිරක්ෂණ සහ විශ්‍රාම වැටුප් අරමුදල්" ආර්ථික කටයුත්ත ප්‍රසාරණය හෝ පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් බලපානු ලබනනේ කර්මාන්තය තුළ උපයන ලද වාරික සහ දරන ලද හිමිකම් වැඩිවීම හෝ අඩුවීමයි. මේ අනුව, 2025 දෙවන කාර්තුවේදී, උපයන ලද දළ වාරිකය සියයට 15.1කින් වැඩි වූ අතර දරන ලද දළ හිමිකම් සියයට 9.4කින් වැඩි විය. එබැවින් මිල වෙනස්කම් ගැලපීමෙන් පසු, මෙම දර්ශක දෙක එක්ව 2025 දෙවන කාර්තුව සඳහා රක්ෂණ සේවාවන්හි සියයට 10.1 ක වර්ධනයක් වාර්තා කරන ලදි.

2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව, 2025 වසරේ දෙවන කාර්තුවේදී "දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" යන ආර්ථික ක්‍රියාකාරකම සියයට 3.4ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙම වර්ධනයට අනුකූලව, කොළඹ කොටස් වෙළඳපොළේ ලියාපදිංචි දේපළ වෙළඳාම් සමාගම් දහනවයක කාර්තුමය පිරිවැටුම, 2024 දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 3.5කින් ඉහළ ගොස් තිබේ. මෙම ආර්ථික ක්‍රියාකාරකමෙහි ස්ථාවර මිල ගණන් යටතේ එකතු කළ අගය රුපියල් මිලියන 128,593ක් වන අතර, පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදනයට එහි දායකත්වය සියයට 3.9ක් වේ.

2025 වසරේ දෙවන කාර්තුවේදී, වෘත්තීය සේවා උප ආර්ථික කටයුත්ත සියයට 3.9ක වර්ධනයක් වාර්තා කර තිබේ. මෙම උප ආර්ථික කටයුත්ත ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 54,685ක වටිනාකමක් වාර්තා කර ඇති අතර, පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය සියයට 1.9ක් පමණ වේ. වෘත්තීය සේවා යටතට ප්‍රධාන වශයෙන් "නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහ නිර්මාණ හා ඉංජිනේරු කාර්යයන්", "විද්‍යාත්මක පර්යේෂණ", "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ", "පශුවෛද්‍ය කාර්යයන්", "කුලී හා බදු කාර්යයන්", "රැකියා නියෝජිත ආයතන" සහ "ගොඩනැගිලි හා උද්‍යාන සැකසීම" වැනි ආර්ථික ක්‍රියාකාරකම් 8ක් ඇතුළත් වේ. මෙම අංශයේ වටිනාකම ගණනය කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් එකතු කළ අගය මත පනවන බදු (VAT) දත්ත මත පදනම්වය.

2025 වසරේ දෙවන කාර්තුවේදී මානව සෞඛ්‍ය සේවා අංශය සියයට 3.9 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වර්ධනය මඟින් පෙර වසරට සාපේක්ෂව මෙම අංශයේ ආර්ථික ක්‍රියාකාරකම්වල සිදුවූ සැළකිය යුතු ප්‍රසාරණය පෙන්නුම් කරයි. 'කොළඹ කොටස් වෙළඳපොලේ' ලියාපදිංචි කර ඇති දිවයිනේ ප්‍රධාන රෝහල් හයක ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන්ගේ දෙවන කාර්තුවේ (අප්‍රේල් සිට ජූනි දක්වා) දත්ත අනුව, එම රෝහල්වල කාර්තුමය පිරිවැටුම 2024 වසරේ දෙවන කාර්තුවේ මූල්‍ය ප්‍රකාශන (අප්‍රේල් සිට ජූනි දක්වා) දත්ත හා සසඳන විට සියයට 16.2කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම, මෙම කාර්තුව තුළදී ඊ් චැනලින් සේවාවන් සියයට 10.7 ක වැඩි වීමක් පෙන්නුම් කර ඇත. මෙම කාර්තුව තුළ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සෞඛ්‍ය උප දර්ශකයට අනුව එහි දර්ශක අගය 195.0 සිට 203.7 දක්වා සියයට 4.5 කින් ඉහළ ගොස් ඇත. එය 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ දෙවන කාර්තුවෙහි සෞඛ්‍ය අංශයේ මිල මට්ටම්වල යම් වැඩිවීමක් පෙන්නුම් කරයි.

වර්තන මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට සියයට 4.3ක දායකත්වයක් සපයන "අනෙකුත් පුද්ගලික සේවා ක්‍රියාකාරකම්"යන ආර්ථික කටයුත්ත "කලා සහ පොදු විනෝදාස්වාදය", "වෙනත් පුද්ගලික ක්‍රියාකාරකම්" සහ "සේවායෝජකයන් ලෙස ඇති ගෘහ ඒකක වල කටයුතු" යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. 2024 වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දි වාර්තා වී ඇත්තේ සියයට 1.2 ක වර්ධනයක් වන අතර ඒ සඳහා දේශීය විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණයක් ඇති ස්ථාන නැරඹීමේ දී අයකරන ප්‍රවේශ පත්‍ර ගාස්තු වල ආදායම ඉහළ යාම මෙන්ම දෘශ්‍ය කලා (චිත්‍රපට, වේදිකා නාට්‍ය, එළිමහන් ප්‍රසංග ආදී) ආර්ථික කටයුතු වල වැඩිවීම, විවාහ සහ මරණ සංඛ්‍යාවේ වැඩිවීම බලපා ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සංඛ්‍යාන මන්දිරය

අංක.306/71,පොල්දූව පාර

බත්තරමුල්ල

info@statistics.gov.lk

+94 11 2147000

+94 11 2147011

statistics.gov.lk


මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.


දෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

National.accounts@statistics.gov.lk

+9411 2147071 +94 112877938